# දියුණු රටක් ලෙස ඉදිරියට යාමේදී පරිගණක තාක්ෂණය අත්‍යවශ්‍යයි

## – ආචාර්ය ඒ. ඇස්. ඉඳුරුව

**මහින්ද කුලතුංග විසිනි**

ලෝකයේ දියුණු රටක් ලෙස ඉදිරියට යාමේදී තොරතුරු තාක්ෂණය ඉතාමත් ප්‍රයෝජනවත් වන්නාසේම එයට පරිගණක තාක්ෂණයද අත්‍යවශ්‍ය වී ඇතැයි මොරටුව සරසවියේ පරිගණක විද්‍යා අංශයේ ආචාර්ය ඒ. ඇස්. ඉඳුරුව මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා එසේ පැවැසුවේ කොළඹ තාලන්ද විද්‍යාල කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමයේ 16 වැනි වාර්ෂික මහා සභා රැස්වීම අමතමිනි.

කුප්පියාවත්තේ බෝධානන්ද හිමි පිරිස පන්සිල්හි පිහිටැවූහ.

තාලන්ද විද්‍යාලීය ආදි සිසුවකු වන ඉඳුරුව මහතා මෙසේද කීය.

“අද වර්තමාන ලෝකයේ එකිනෙක රටවල් හා පවතින බැඳීම පවතින්නේ තොරතුරු තාක්ෂණය මතයි. පසුගිය දශකය දෙස බලන විට තොරතුරු තාක්ෂණය තුළින් පරිගණක තාක්ෂණය ඉස්මතු වී තිබෙනවා. නූතන ලෝකයේ තොරතුරු තාක්ෂණයෙන් තොරව සිටින රටවලට හුදෙකලාවීමට සිදුවෙනවා. සමාජ වශයෙන් මෙන්ම ආර්ථික වශයෙන්ද පිරිහීමට ලක්වෙනවා.

අද කර්මාන්තත් ගොවිතැනත් දියුණුවට තොරතුරු තාක්ෂණය සමඟින් පරිගණක තාක්ෂණයද අත්‍යවශ්‍යයි. විද්‍යා ප්‍රබන්ධකයකු වන ආතර් සී. ක්ලාක් මහතා වරක් කීවා “නව නොබෝ දිනකින් පරිගණකය දුරකථනය බවට පත්වන” බව.

ලෝකය දෙස බලන විට අපට එය පැහැදිලිවම දකගැනීමට පුළුවන්. ශ්‍රී ලංකාවෙත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව පරිගණක තාක්ෂණය උපයෝගී කරගෙන ලක්ෂ සංඛ්‍යාත සිසුන්ගේ විභාග කටයුතු මෙහෙයවනවා.

ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට භාෂා විද්‍යාගාරයක් ඉදිකළ තාලන්ද විද්‍යාලයටද එහි සාර්ථකත්වයද පරිගණක තාක්ෂණය ඉවහල් වන බැවින් ඒ සඳහා තමාට පුළුවන් සෑම උපකාරයක්ම කරන්නේ යැයිද ඒ මහතා කීය.

තාලන්ද විද්‍යාලයාධිපති ඩී. ජේ. සුමනසේකර මහතා බොහෝ විද්‍යාලවල ආදි ශිෂ්‍ය සංගම්වල සාමාජිකයින්ගේ උනන්දුව සහ උත්සාහය විද්‍යාල සංවර්ධනයට මද වශයෙන් ලැබුණත් තාලන්ද විද්‍යාලයේ කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය අන් විදුහල්වලට ආදර්ශයකැයි කීය.

මේ ආදි ශිෂ්‍ය සංගමය සතු අරමුදලද ඉතා විශාලවීම සතුටට කරුණකියි ද විදුහල්පතිවරයා කීය.

කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු සභාපති අක්ෂිත් පුංචිහේවා මහතා පිළිගැනීමේ කතාව කෙළේය.

නව ලේකම් වරුණ රත්නවීර මහතා ස්තුති කතාව කෙළේය.

සංගමයේ නව සභාපති රංජිත් පෙරේරා සංගමයේ ප්‍රථම සභාපති සුසන්ත අබේසේකර හා අයි. වී. හේමචන්ද්‍ර මහත්වරුද කතා කළහ.

නව නිලධාරී මණ්ඩලයක්ද තෝරා පත්කැර ගැනිණි.

දිනමිණ වර්ෂ 1991 ක්වූ සැප්තැම්බර් මස 16 වැනිද සඳුද